**ජාතික ගමනාගමන කොමිෂන් සභාව**

**අන්තර් පළාත් මාර්ග වල බස්රථ ධාවන බලපත්‍රලාභීන් වෙත කෙරෙන නිවේදනයයි !**

කොරෝනා වසංගතය හමුවේ කාර්යාලවල රාජකාරි වලට පැමිණෙන සේවකයින් සහ මහජනතාවගේ ගමන් පහසුව සඳහා නාරාහෙන්පිට හා බත්තරමුල්ල නගර දක්වා පහත ගමනාන්ත වල සිට කාර්යාල ආරම්භ කරන හා අවසන් කරන වේලාවන් වලදී ධාවනය කිරීම සඳහා බස් රථ ඉදිරියේදී අන්තර් පළාත් බස් රථ ධාවනයට අවසරයක් ලැබූ විට තාවකාලික අවසරපත්‍ර මත ධාවනයේ යෙදවීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව තීරණය කර ඇත.

**නාරාහේන්පිට දක්වා (සුඛෝපභෝගී සේවා)**

1. ගාල්ල
2. මහනුවර
3. කුරුණෑගල (මාර්ග අංක 06)
4. රත්නපුර
5. හලාවත

**බත්තරමුල්ල දක්වා (සුඛෝපභෝගී සේවා)**

1. කුරුණෑගල (මාර්ග අංක 06)
2. රත්නපුර
3. හලාවත
4. මහනුවර

**ඇල්පිටිය-නාරාහේන්පිට දක්වා (සාමාන්‍ය සේවා)**

දැනට ඉහත සඳහන් ගමනාන්ත වල සිට කොළඹ දක්වා ධාවනය කිරීම සඳහා ජාතික ගමනාගමන කොමිෂන් සභාව මගින් නිකුත් කර වලංගුව පවතින මගී සේවා අවසරපත්‍ර හිමි ධාවකයින් සඳහා මේ සඳහා ඉල්ලුම් කිරීමට අවස්ථාව ලබා දී ඇත.

ඒ අනුව මේ මාර්ග වල ධාවනය කිරීම සඳහා අපේක්ෂා කරනු ලබන බලපත්‍රලාභීන් පහත සඳහන් විශේෂ කොන්දේසි වලට යටත්ව ඒ සඳහා ඉල්ලීම් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ධාවන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දැනුම් දෙමි.

විශේෂ කොන්දේසි,

- ආසන ගත මගීන් පමණක් රැගෙන යාම.
- එන්නත් මාත්‍රා දෙකම ලබාගත් රියදුරු හා කොන්දොස්තර සේවයේ යෙදවීම.
- සෞඛ්‍ය ආරක්ෂිත ක්‍රමවේද අනුගමනය කිරීම.

සභාපති,
ජාතික ගමනාගමන කොමිෂන් සභාව.
2021.10.27